(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 18.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2015 නොවැම්බර් මස 21 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පළාත් සභා හා පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ජේ. ජේ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු සිවශක්ති ආනන්දන් මහතා

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන**: කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 97 සහ 2015 ඔක්තෝබර් මස 23 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව 2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස පත් කරන ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය පිණිස ගරු. මහින්ද සමරසිංහ මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ම'විසින් නම් කරනු ලැබ ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි:-

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු චන්ද්‍රිම වීරක්කොඩි මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු එස්. ශ්‍රීතරන් මහතා"

**II**

"2015 ඔක්තෝබර් මස 23 වැනි දින මා විසින් කරන ලද නිවේදනයට අමතරව පාර්ලිමේන්තුවේ අංක 125 වැනි ස්ථාවර නියෝගය සහ 2015 නොවැම්බර් මස 04 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභිකයින් වශයෙන් නම්කර ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි:-

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු ෆයිසර් මුස්තාපා මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා"

**III**

"2015 ඔක්තෝබර් මස 23 වැනි දින මා විසින් කරන ලද නිවේදනයට අමතරව පාර්ලිමේන්තුවේ අංක 126 වැනි ස්ථාවර නියෝගය සහ 2015 නොවැම්බර් මස 04 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභිකයින් වශයෙන් නම් කර ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි:-

ගරු රවුෆ් හකීම් මහතා

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා"

**IV**

"පාර්ලිමේන්තුවේ අංක 128 වැනි ස්ථාවර නියෝගය සහ 2015 නොවැම්බර් මස 04 වැනි දින සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීන් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභිකයින් වශයෙන් නම්කර ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි:-

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු කනක හේරත් මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු එස්. සිවමෝහන් මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්,

(i) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2012 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2012 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iv) 2012 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(v) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(vi) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(vii) 2012 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(viii) 2012 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව;

(ix) 2012 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(x) 2012 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xi) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xii) 2013 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(xiii) 2013 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ නව වන වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අදාළ උපදේශක කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එම වාර්තා ඊට අනුකූලව, අංක 109 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ අදාළ උපදේශක කාරක සභාවට යොමු කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,

(i) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13(1)(ඇ) වැනි වගන්තිය සහ 16 වැනි වගන්තිය සමග කියවිය යුතු 112 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 25 දිනැති අංක 1907/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iv) කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ, 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය; (අංක 975, 976 සහ 977 දරන සුරාබදු නිවේදන)

පිළිගන්වන ලදී.

එම ලිපි ලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 ජූනි 8 දිනැති අංක 1918/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යය පටිපාටි) පිළිබඳ නියෝග පිළිගන්වන ලදී.

එම ලිපි ලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වන ලදී.

එම ලිපි ලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. විසර්ජන පනත් කෙටුම්පත (2016) — (පළමුවැනි වෙන් කළ දිනය) :** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2015 නොවැම්බර් 20),—

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ. භා. 10.58 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

(අ. භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.11 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.45 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.36 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

"විවාදය දැන් කල් තැබිය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී; එතැන් සිට විවාදය 2015 නොවැම්බර් මස 23 වන සඳුදා පවත්වනු ලැබේ.

**5. 2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2015 ඔක්තෝබර් මස 23 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද "2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව" නමැති යෝජනාවේ ඇමුණුමේ සඳහන් "(xiv) දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය" ඉවත් කර ඒ වෙනුවට "(xiv) විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය" ආදේශ කිරීමෙන් එකී ඇමුණුම සංශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; පාර්ලිමේන්තුව අ. භා. 6.20 ට, 2015 නොවැම්බර් මස 06 වැනි දින සභා සම්මුතිය අනුව, 2015 නොවැම්බර් මස 23 වැනි සඳුදා පූ. භා. 9.30 වනතෙක් කල් ගියේය.